## අනගාරික ධර්මපාලතුමා සහ විදේශ සබඳතා

**මහාචාර්ය ඩබ්. එම්. කේ. විජේතුංග**
ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

අනගාරික ධර්මපාලතුමා බිහිවීමට පසුබිම සැකසෙන ලද්දේ එවකට ලංකාවේ ගොඩනැගී තිබූ සමාජ පරිසරයයි. එතුමා භාෂා රාශියක ප්‍රවීණයෙකු වූ බැවින් බොහෝ විද්වතුන් පිරිසකගේ සමීප ඇසුර පැවැත්වීමට ඔහුට හැකිවිය. ඉංග්‍රීසි භාෂාව, සිංහල භාෂාව, පාලි භාෂාව, සංස්කෘත භාෂාව වැනි භාෂා කිහිපයක් චතුර ලෙස කතා කිරීමට සහ ලිවීමට ඇති හැකියාව, ඔහු විසින් ස්ව උත්සාහයෙන් ගොඩනගා ගත්තක් වීම මෙහිදී විශේෂිත වේ. වයස අවුරුදු 16 වන විට ලංකාවට පැමිණි ඕල්කට්තුමාට සහ බ්ලැවැට්ස්කි මැතිණියගේ භාෂා පරිවර්තන කාර්යය ඉටු කිරීමේ වගකීම අනගාරික ධර්මපාලතුමාට පැවරිණි. එතුමා ලංකාව තුළ සැරිසරමින් ඕල්කට්තුමා සහ බ්ලැවැට්ස්කි මැතිණියට ලංකාවේ සැබෑ තත්ත්වය අවබෝධ කිරීමට කටයුතු කළ අතර, එහි දී ප්‍රධාන වශයෙන් කරුණු දෙකක් පිළිබඳව අනගාරික ධර්මපාලතුමාගේ අවධානයට ලක්විය. එහි පළමු කාරණය වන්නේ ලංකාවේ සමාජ සන්දර්භය ආරක්ෂා කරගැනීමට සිංහල බෞද්ධ භික්ෂුව ආරක්ෂා කර ගත යුතුය යන්නයි.

දෙවන කාරණය වන්නේ ශ්‍රී ලංකාව පිළිබඳ යහපත් ප්‍රතිරූපයක් ලෝකයේ ගොඩ නැංවීමයි. මෙම කාරණාවන් දෙකම වඩාත් හොඳින් ආරක්ෂා කර ගැනීමට එතුමා විසින් කටයුතු කරන ලදි. එහිදී එතුමා විසින් විදේශීය මතවාදය යහපත් අයුරින් ගොඩනගා ගැනීමට ජාත්‍යන්තර සබඳතා ශක්තිමත් කර ගැනීමට පියවර රාශියක් අනුගමනය කරන ලදි. එංගලන්ත සංචාරයක නියුතු ධර්මපාලතුමන් විසින් මුණගැසුණු එඩ්වින් අර්නෝල්ඩ්ගේ අදහසට අනුව ඉන්දියාවේ බුද්ධගයාව ආශ්‍රිතව පූජස්ථාන හින්දු පූජකයන්ගෙන් බේරා ගැනීමට කටයුතු කරන ලදි. අනගාරික ධර්මපාලතුමන් 1893 ඇමරිකාවේ ලෝක ආගම් සමුළුවට සහභාගී වීමත් එහි දී එතුමන් සිදු කරන ලද කතාව ප්‍රබල ජනමතයක් සැකසීමට සමත් විය. සමුළුව අතරවාරයේ දී එතුමන්ගෙන් අසන ලද සියලුම ප්‍රශ්නවලට පිළිතුරු දීමට ඔහුට හැකි වූ අතර මෙම දේශනය අවසානයේ විදේශ රටවල් කීපයකින් ම පැමිණි නියෝජිතයින්ගෙන් එතුමන්ට ඒ ඒ රට වල සංචාරය කිරීමට ආරාධනා ලැබිණි. මෙම ආරාධනා පිළිගනිමින් අනගාරික ධර්මපාලතුමන් ජපානය ඉන්දියාව වැනි රටවල් රාශියක සංචාරය කරමින් බෞද්ධාගම ආරක්ෂා කර ගැනීමට අවශ්‍ය වැඩකටයුතු සංවිධානය කරන ලදි. ඒ ඔස්සේ ලංකාව පිළිබඳ යහපත් ප්‍රතිරූපයක් ජාත්‍යන්තර වශයෙන් ගොඩනැගීමට එතුමාට හැකිවිය.